කැලණිය ප්‍රාදේශීය සභාව
ගම්පහ දිස්ත්‍රික්කය
--------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**
------------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
-------------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුලි 31 දින ද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 සැප්තැම්බර් 30 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කළ මතය**
----------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට කැලණිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
---------------------------------------------------

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**
---------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දේපල සංවර්ධනය කිරීම වෙනුවෙන් දරාතිබූ රු.8,399,570 ක් හා රු.7,000,000 ක් වූ ජෙනරේටර් 03 ක වටිනාකම ප්‍රාග්ධනිතකර නොතිබුණි. | වත්කම් ප්‍රාග්ධනිත කළයුතු වේ. | 2020 අවසන් ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපෘති 15 කට අදාලව ණයහිමි වෙන්කිරීම් රු.2,937,741 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | 2020 අවසන් ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | ගබඩා තොග ලෙස ගිණුම්වල දැක්වියයුතු රු.552,080 ක් වටිනා භාණ්ඩ වර්ග 07 ක් වෙනත් කාර්යාල උපකරණ ලෙස ප්‍රාග්ධනිතකර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | 2020 අවසන් ගිණුමේ නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 1.3.2 නොසැසඳුනු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 10 ක ශේෂ එකතුව හා උපලේඛන අනුව එම ශේෂයන්ගේ එකතු වටිනාකම අතර රු.215,394,962 ක වෙනසක් විය. | ලේඛන, උපලේඛන හා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළයුතු වේ. | 2020 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | හිඟ ආදායම් වාර්තා අනුව වරිපනම් බදු හා වෙළඳ ස්ථාන කුලී පිළිවෙලින් රු.27,817,847 ක් හා රු.508,493 ක් වුවද මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත්කර ඇති උපලේඛන අනුව පිළිවෙලින් රු.36,737,134 ක් හා රු.637,533 ක් වූයෙන් රු.9,048,327 ක වෙනසක් විය. | හිඟ ආදායම් වාර්තා හා උපලේඛන නිවැරදිව පිළියෙල කළයුතු වේ. | 2020 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | ප්‍රාග්ධනයට ආදායමින් දායකවීමේ හා පරිත්‍යාග ගිණුම් වල එකතුව හා ස්ථාවර වත්කම් වල එකතුව අතර රු.439,450 ක වෙනසක් විය. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | 2020 අවසන් ගිණුමේ නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 1.3.3 විගණනය සඳහා අවශ්‍ය සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.568,125,061 ක් වූ ගිණුම් 07 ක් සඳහා අවශ්‍ය තොරතුරු විගණනය සඳහා ඉදිරිපත්කර නොතිබුණි. | විගණන සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කළයුතු වේ. | අදාල නිවැරදි කිරීම් මේ වන විට සිදු කෙරෙමින් පවතී. |

## 1.4 අනුකූල නොවීම්

### නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| | නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1946 අංක 30 දරන බදු හා තක්සේරුකරණ පනත | වරිපනම් බදු වර්ෂ 5 කට වරක් තක්සේරු ගතයුතු වුවද අවසන් වරට වරිපනම් බදු තක්සේරු කර තිබුණේ 2009 වර්ෂයේදීය. | පනත් ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371(2) | 2019 දෙසැම්බර් 31 වන විට අවස්ථා 12 කදී ලබාගත් රු.735,540 ක් වූ අත්තිකාරම් පියවා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | අත්තිකාරම් පියවීමට කටයුතු කරමි. |
| (ඇ) | ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ උපදේශක චක්‍රලේඛ අංක 2004/පුස්/1 | 2018 හා 2019 වර්ෂවල සමීක්ෂණයෙන් වාර්තා කරන ලද රු.433,585 ක් වටිනා නැතිවූ පොත් පිළිවෙලින් 1518 ක් හා 2308 ක් සම්බන්ධයෙන් කටයුතුකර නොතිබුණි. | අදාල චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | මේ වන විට වගකිවයුතු පාර්ශවයන්ගෙන් අය කර ගැනීම පිණිස කටයුතු කරමින් පවතී. |

1.5 **ලැබිය යුතු ශේෂ**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ලැබිය යුතු කර්මාන්ත ආධාර රු.141,727,596 ක් වූ අතර 1997 සිට 2019 දක්වා කාල පරාසයකට අයත් පෙර ගෙවුම් රු.5,752,474 ක් විය. | ලැබියයුතු ශේෂ අයකරගැනීමට කටයුතු කළ යුතුය. | අදාළ අනුමැතීන් ලබාගෙන ඉදිරි කටයුතු සිදු කරන බව දන්වමි. |

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.94,173,429 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.93,491,106 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

2.2.1 **ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 වර්ෂය | | | | 2018 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 87,700,000 | 61,005,442 | 64,768,811 | 33,307,597 | 50,000,000 | 53,020,745 | 51,059,743 | 25,765,547 |
| කුලී | 23,215,935 | 22,058,310 | 20,473,763 | 7,960,721 | 10,260,959 | 18,111,609 | 17,833,358 | 5,572,653 |
| බලපත්‍ර ගාස්තු | 3,851,000 | 1,781,630 | 3,583,259 | 0 | 1,600,000 | 1,790,236 | 1,790,236 | - |
| වෙනත් ආදායම් | 314,901,500 | - | 273,368,931 | 1,458,347 | 273,198,000 | 273,198,000 | 259,794,989 | - |
| | 429,668,435 | 84,845,382 | 362,194,764 | 42,726,665 | 335,058,959 | 346,120,590 | 330,478,326 | 31,338,200 |

### 2.2.2 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 31 දිනට පැවති රු.36,737,139 ක් වූ වරිපනම් හිඟ ශේෂයේ වර්ෂ 1 ට අඩු රු.9,807,809 ක්ද,වර්ෂ 1-3 අතර රු.7,521,186 ක්ද, වර්ෂ 3-5 ත් අතර රු.5,738,969 ක්ද, වර්ෂ 5-10 ත් අතර රු.9,517,119 ක්ද, වර්ෂ 10 ට වැඩි රු.4,152,053 ක්ද පැවතුණි. | හිඟ වරිපනම් අයකිරීමේ ක්‍රියාමාර්ග වැඩිකරගැනීම, දේපල තහනම් කිරීමේ නිවේදන නිකුත්කර හිඟ වරිපනම් ගෙවීමට දිරිගැන්වීම කළ යුතු වේ. | මේ වන විටත් සමීක්ෂණය අඛණ්ඩව සිදු කරමින් පවතින අතර නෛතිකව අය කළ හැකි මුදල් අය කර ගැනීමේ කටයුතු ද අඛණ්ඩව සිදු කරමින් පවතී. |

### 2.2.3 කඩ කුලී

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට කඩ කාමර 133 කට අදාලව පැවති රු.2,785,707 ක හිඟය අයකරගැනීමට කටයුතුකර නොතිබුණි. | හිඟ කඩ කුලී අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ආ) | තොරණ හන්දිය කිරිබත්ගොඩ පොදු වෙළඳපල හා හුණුපිටිය නව වෙළඳපල කඩකාමර 22 ක් අතුරු බදු දී තිබුණි. මෙහිදී සභාව විසින් | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | අතුරු බදු පැවරීමට ලක් නොවූ අතුරු බදු කරුවන් අතුරු බදු පැවරීමට ලක් කිරීමට ඉදිරියේ දී කටයුතු කරමි. |

රු.100 සිට රු.3,100 දක්වා වූ මාසික කුලියකට ලබාදී තිබූ කඩකාමර බදුකරුවන් විසින් රු.3,500 සිට රු.15,000 දක්වා වූ මාසික කුලියකට අතුරු බදු දී තිබුණි.

2.2.4 **වෙනත් ආදායම්**

**පරිසර බලපත්‍ර**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පරිසර බලපත්‍ර අළුත් කළයුතු බවට හඳුනාගෙන ඇති ව්‍යාපාර 03 කට පරිසර බලපත්‍ර ලබාදීමට කටයුතුකර නොතිබුණි. | පරිසර බලපත්‍ර ආදායම් අයකිරීමට කටයුතු කළයුතු වේ. | ආයතන 03 ක් පරිසර බලපත්‍රය අලුත් කිරීම සඳහා අයදුම්පත් රැගෙන ගොස් ඇත. |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිලිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) **ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් ක්‍රියාකාරකම් 08 ක් ක්‍රියාත්මක කිරීමට සභාව අපොහොසත්වී තිබුණි. | ඉටුකළයුතු කාර්යයන් සියල්ලම ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කරගෙන අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගතයුතු වේ. | ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමි. |

(ආ) **අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබුණු විවිධ කර්තව්‍යයන් 04 ක් ඉටුකිරීම සඳහා රු.මිලියන 17 ක මුදලක් වාර්ෂික අයවැයෙන් වෙන්කරගෙන තිබුණත් එම මුදල් වැයකර නිමවුම් මට්ටමට ළඟාවී නොතිබුණි. | ව්‍යාපෘති වල නිසි පරිදි නිමවුම් කටයුතු ළඟා කරගැනීමට කළමනාකරුගේ අවධානය යොමු කරවමි. | ක්‍රියාකාරී සැලැස්මේ පරිදි අදාල කර්තව්‍යයන් ඉටුකිරීමට කටයුතු කරමි. |

(ඇ) **අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2016 වර්ෂයේ රු.27,983,429 ක් වැයකර කැලණිය බස්නැවතුම්පල කඩකාමර ඉදිකර තිබුණි. අයිතිය තහවුරු කරගැනීමකින් තොරව ඉදිකිරීම් සිදුකර තිබීම හේතුවෙන් 2016 වර්ෂයේ සිට සභාවට අත්පත් කරගතහැකිව තිබූ ප්‍රතිලාභ 2019 වර්ෂය තෙක් අහිමිව තිබුණි. | අයිතිය තහවුරු කිරීමෙන් තොරව ඉදිකිරීම් සිදු නොකළ යුතු වේ. | සකස් කරන ලද පිඹුර 2019 මැයි 09 දින තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. අදාළ තක්සේරුව ලද පසු කැලණි විහාරය සමඟ බදු ගිවිසුමකට එළඹීමට කඩිනමින් කටයුතු කරමි. |

(ඇ) **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කසළ අපහරණ ක්‍රියාවලියේදී කසළ දමන ස්ථානයට රු.22,500,000 ක් හා වාහන කුලියට ගැනීම වෙනුවෙන් රු.14,761,000 ක වියදමක් දරා තිබුණු අතර කසළ ප්‍රවාහනය සඳහා සභාව සතු වාහන යොදවා නොගෙන කුලී වාහන ලබාගැනීම වෙනුවෙන් පෞද්ගලික ආයතනයකට 2019 වර්ෂය තුළදී රු.12,413,500 ක් ගෙවීම්කර තිබුණි. | සභාව සතු වාහන වලින් උපරිම ප්‍රයෝජනයක් ගතයුතු වේ. | දෛනිකව ප්‍රාදේශීය සභාව මගින් කසල ටොන් 55 - 60 ත් අතර ප්‍රමාණයක් එකතු කිරීම සිදු කරනු ලබයි. එබැවින් මුතුරාජවෙල කසල උද්‍යානය වෙත කසල යොමු කිරීම සඳහා ටිපර් රථ යොදා ගැනීමට සිදු වී ඇත. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ද්විතියික මට්ටමේ තනතුරු 04 ක් පුරප්පාඩුව පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කරගැනීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරමි. |
| (ආ) | 2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක 2018/02 දරන චක්‍රලේඛයේ 6.1 ඡේදය ප්‍රකාරව අවම වශයෙන් පැය 12 ක් ආවරණය වන පරිදි සේවක පුහුණුවීම් ලබාදීමට කටයුතුකර නොතිබුණි. | සේවක පුහුණුවීම් යාවත්කාලීනව ලබාදීමට කටයුතු කළයුතු වේ. | පුහුණු වැඩසටහන් වෙත යොමු කිරීමට නොහැකි වූ බව දන්වමි. 2020 වර්ෂයේදී කටයුතු කරමි. |
| (ඇ) | 2016, 2018 හා 2019 වර්ෂ වල ස්ථාන මාරුවී ගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් රු.249,340 ක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කඩිනමින් අයකිරීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී අයකිරීමට කටයුතු කරමින් පවතී. |

## 3.3 වත්කම් කළමනාකරණය

### 3.3.1 වත්කම් ලේඛනගත නොකිරීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කරනලද ඉඩම් හා ගොඩනැගිලි 25 ක වටිනාකම සඳහන් කිරීමට කටයුතුකර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව නඩත්තු කළයුතු වේ. | සභාව සතු සියළුම දේපළ තක්සේරු කිරීම සඳහා පත් කරන ලද තක්සේරු මණ්ඩලයෙන් සභාව සතු දේපළ තක්සේරු කිරීමට කටයුතු කර ඇත. |
| (ආ) | 2019 වර්ෂයේ සිදුකළ වත්කම් සමීක්ෂණයට අනුව ඉඩම් හා ගොඩනැගිලි 4 ක් හා ක්‍රීඩා පිට්ටනි 02 ක්, ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත්කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව නඩත්තු කළයුතු වේ. | මෙම නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රත්‍යාගණන මණ්ඩලය වෙත යොමු කර ඇත. |

3.3.2 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේ සමීක්ෂණය මගින් හඳුනාගත් ඉඩම් හා ගොඩනැගිලි 57 ක් අතුරින් ඔප්පු නොමැති ඉඩම් 43 ක් විය. මෙම දේපල සඳහා සැලසුම පමණක් සභාව සතුව පැවති අතර දේපල 05 ක් සඳහා කිසිදු ලියවිල්ලක් නොතිබුණි. | වත්කම් වල හිමිකම සනාථ කරගැනීමට කටයුතු කළයුතු වේ. | සභා සම්මත කර ගන්නා ලද පරිදි සභාව සතු ඉඩම් සඳහා පිඹුරුපත් හා ඔප්පු සැකසීමට අනුමැතිය ලබාගෙන ඉදිරි කටයුතු සිදු කර ඇත. |
| (ආ) | කිරිබත්ගොඩ ජිනදාස නන්දසේන මාවතේ පිහිටි ත්‍රිකෝණාකාර ඉඩමෙහි අනවසර ඉදිකිරීම හා නාහේන ප්‍රීතිපුර නිවාස ක්‍රමයේ පොදු ළිඳ ගොඩකර යාබද ඉඩම් හිමියන් සිය ඉඩමට යාකර ගැනීම සම්බන්ධයෙන් සභාව විසින් කටයුතු කර නොතිබුණි. | අනවසර ඉදිකිරීම් හා පොදු ළිඳ ගොඩ කිරීම පිළිබඳව නීතිමය කටයුතු කළයුතු වේ. | ඉඩමේ අනවසර ඉදිකිරීමට එරෙහිව නීතිමය කටයුතු සිදු කරමින් පවතී. |
| (ඇ) | වෙදමුල්ල කිංග්ස්ටන් ඉඩම හා වෙදමුල්ල පිලපිටිය කෝන්ගහවත්ත ඉඩම යන ඉඩම් පිහිටි ස්ථාන සොයාගැනීමට හෝ නොහැකි අයුරින් බාහිර පාර්ශව විසින් අත්පත් කරගෙන තිබුණු අතර දළුගම සුසානභූමිය අසල ඉඩමේ මේ වන විට පන්සලක් ඉදිකර තිබුණි. | සභා ඉඩම් ආරක්ෂා කරගැනීමට කටයුතු කලයුතු වේ. | වෙදමුල්ල කිංග්ස්ටන් විලාස් ඉඩම /වෙදමුල්ල පිලපිටිය කෝන්ගහවත්ත ඉඩම යන ස්ථාන ස්ථාවර වත්කම් ලේඛනගත වී තිබුණ ද එම ඉඩම් භෞතිකව සොයා ගත නොහැක. |
| (ඈ) | නාහේන සිරිපුර ක්‍රීඩාපිටිය, ගුරුන්නාන්සේවත්ත නිවාස සංකීර්ණයේ පැවති ක්‍රීඩා පිටිය හා ළමා උයන දක්නට නොතිබූ අතර එක් ක්‍රීඩා පිටියක බුදු මැදුරක් ඉදිකර තිබුණි. | අදාල ක්‍රීඩා පිටිය හා ළමා උයන පවරාගැනීමට කටයුතු කළයුතු වේ. | මෙම ඉඩම සභාවට පවරා ගැනීමට කටයුතු කරමින් පවතී. |

### 3.4 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව සතු ටොන් 08 මාර්ග තලනය, බාව් යන්ත්‍රය, ස්කැවේටර් යන්ත්‍රය හා ඩම්ප් ට්‍රක් රථය ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රියව පැවතුණි. | ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළයුතු වේ. | මාර්ග තලනය වෙනත් ආයතනයකට දීමට කටයුතු කර ඇත. |
| (ආ) | 2019 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයට අනුව සභාව සතු අංක රහිත ට්‍රැක්ටර් ට්‍රේලර් 09 ක්, අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගතහැකි ට්‍රේලර් වැසි 02 ක් හා අත්ට්‍රැක්ටරයක් පැවතුණි. | අදාල ටේලර් අළුත්වැඩියාව කඩිනමින් කළයුතු වේ. | ටේලර් 02 මේ වන විට අළුත්වැඩියා කරමින් පවතී. |
| (ඇ) | පොල්හේන පුස්තකාලයේ උඩුමහල කිසිඳු ප්‍රයෝජනයකට ගෙන නොතිබුණි. | ප්‍රයෝජනවත් කාර්යයකට යෙදවීමට කටයුතු කළයුතු වේ. | ගොඩනැගිල්ල මේ දක්වා ම ප්‍රාදේශීය ලේකම් කාර්යාල සතුව පවතින බැවින් එකී අයිතිය පවරා ගැනීමෙන් පසු එය බහුකාර්යය සේවා ගොඩනැගිල්ලක් ලෙස වැඩි දියුණු කිරීමට නියමිතය. |

### 3.5 ප්‍රසම්පාදනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 වර්ෂය තුලදී රු.885,000 කට මිලදී ගන්නා ලද පරිගණක යන්ත්‍ර 05 ක් සහ රු.762,575 කට මිලදී ගන්නා ලද ලැප්ටොප් 04 ක් වෙනුවෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9(ආ) ඡේදය ප්‍රකාරව අදාල ආයතන සමග ගිවිසුම්ගතවී නොතිබුණි. | අදාල මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | ගිවිසුම්ගත වීමට කටයුතු සිදු කරමින් පවතී. |

04. **ගිණුම්කටයුතු භාවය හා යහපාලනය**

**අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී මංමාවත් ඉදිකිරීම වෙනුවෙන් රු.42,044,858 ක් හා පැති කාණු හා බෝක්කු ඉදිකිරීම වෙනුවෙන් රු.2,608,116 ක් වැය විෂයයන් ඉක්මවා වියදම් දරා තිබුණි. | වැය විෂයයන් ඉක්මවා වියදම් නොකළයුතු වේ. | 2019 සැප්තැම්බර් 20 දිනැති විශේෂ මහ සභාව විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදුව ක්‍රියාත්මක කරන ලද බව දන්වමි. |